# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,966 - 2016 මැයි මස 06 වැනි සිකුරාදා - 2016.05.06**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 330 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | — |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — |
| රජයේ නිවේදන ... ... ... | 330 |
| මිල පාලන දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 332 |
| නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


සැ.යු .- රන්ජන් රාමනායක පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 මාර්තු මස 11 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මැයි මස 27 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 මැයි මස 13 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය.''*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති. (වැ. බ.).

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents. gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

329 – B 081054 —402 (2016/05)

A 1-

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත් කිරීම් ආදිය

2016 අංක 271

MOD/DEF/03/02/VNF/RES/68.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

2016 මැයි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) රන්දුනු වීරගේ ආරියසේන, එන්වීඑක්ස් 5476 ශ්‍රීලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 51

2016 අංක 272

MOD/DEF/03/02/VNF/TRN/69.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්වේච්ඡා නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීමක්

2016 මැයි මස 13 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා නාවික හමුදා ස්වේච්ඡා බලකායේ සිට ස්වේච්ඡා නාවික උප සේවයට මාරු කිරීම අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කර ඇත.

ලුතිනන් (ස්වේ) වෙන්ගප්පුලි ආරච්චිගේ පද්මසිරි, එන්වීඑක්ස් 5498 ශ්‍රිලංස්වේනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ඉංජි. කරුණාසේන හෙට්ටිආරච්චි,
ලේකම්,
ආරක්ෂක අමාත්‍යාංශය.

2016 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

05 - 137

# රජයේ නිවේදන

*මගේ අංකය* : ආර්ජී/එන්බී/11/2/48/2014/පිටු/සැ.

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

ඉඩම් ලියාපදිංචි කිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත

මෙහි පහත උපලේඛනයෙහි දෙවෙනි තීරුවේ සඳහන් සහාධිපත්‍ය දේපළ සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමුවන තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති සහාධිපත්‍ය දේපළ ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව, තාවකාලිකව සකස් කර ඇති බැව් ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2016.04.22 වැනි දින සිට 2016.05.06 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම්කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති කෙනෙකු විසින් එකී විරුද්ධත්වය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2016.05.13 වැනි දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3,
ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

**උපලේඛනය**

| *ලියාපදිංචි පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| අනුරාධපුර දිස්ත්‍රික්කයේ, අනුරාධපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එල්.ඩී.ඕ. 20/01 පත්ඉරුව. | උතුරු මැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කුන්චුට්ටු කෝරළයේ, කැබිතිගොල්ලෑව ප්‍රාදේශීය ආදායම් නිලධාරී කොට්ඨාසයේ, තිත්තගෝනෑව පිහිටි 'ගෙවත්ත (ගොඩ)' නමැති ඉඩමට මිනුම්පතිවරයා විසින් මැන සාදන ලද අ.ග.පි. 1631 දරන පිඹුරේ කැබලි අංක 200 දරන ඉඩමට මායිම්,<br><br>*උතුර* : කැබලි අංක 217<br>*නැගෙනහිර* : කැබලි අංක 143, 204<br>*දකුණ* : කැබලි අංක 201<br>*බස්නාහිර* : කැබලි අංක 217<br>බිම් ප්‍රමාණය : හෙක්ටයාර් 0.508 | 01. ජනාධිපති ලේකම් විසින් 1986.08.22 දින ප්‍රදානය කරන ලද අංක අනු/ප්‍ර 14236 දරන දීමනා පත්‍රය. |

05 - 79

---

**1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත 14අ වැනි වගන්තිය යටතේ වන නියමය**

කලින් කල සංශෝධිත 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ ii වැනි වගන්තිය සමග කියවිය යුතු 14 අ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍ය මනෝ ගනේෂන් වන මම මෙම නියමය මගින් ප්‍රජා භාරකාර අරමුදලෙහි කටයුතු පරිපාලනය කිරීම පිණිස අන්තර් කළමනාකරණ මණ්ඩලයක් මෙම නියමය පළ කිරීමේ දින සිට ආරම්භ වන වසර දෙකක කාලයකට හෝ ප්‍රජා භාරකාර අරමුදලෙහි මූල්‍ය කළමණාකරනය යථා තත්වයට පත් කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය වන යම් කාල සීමාවක් සඳහා මෙයින් පත් කරමි.

අන්තර් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් මෙහි උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතුය.

මනෝ ගනේෂන්,
ජාතික සහජීවනය, සංවාද හා
රාජ්‍ය භාෂා අමාත්‍ය.

2016 අප්‍රේල් මස 22 වැනි දින,
බත්තරමුල්ල.

| | |
|---|---|
| 01. ඩබ්ලිව්. ඒ. ඩී. චන්ද්‍රිකා රූපසිංහ<br>අතිරේක ලේකම්,<br>ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය. | - සභාපති |
| 02. රංජිත් විමලසූරිය,<br>අධ්‍යක්ෂ,<br>රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ ජාතික ලේකම් කාර්යාලය. | - සාමාජික |
| 03. ආර්. එම්. බී. විරබණ්ඩාර,<br>ගණකාධිකාරී,<br>ජාතික සහජීවනය, සංවාද හා රාජ්‍ය භාෂා අමාත්‍යාංශය. | - සාමාජික |

05 - 127

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ අංක 29ඇ වගන්තිය යටතේ යෝජනා සම්මතය

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29ඇ දරන වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2016.02.25 වැනි දින පැවැත්වූ එකී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකමතිකව සම්මත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මහජන බැංකුවේ නමට නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. ගුණපාල මහත්මිය විසින් සහතික කරන ලද අංක 1837 සහ 2011.03.14 වැනි දින දරන උකස් බැඳුම්කරය, නීතිඥ හා කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. ගුණපාල මහත්මිය විසින් සහතික කරන ලද අංක 2754 ෂශ 2012.03.31 වැනි දින උකස් බැඳුම්කරය සහ නීතිඥ සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් වී. කේ. ගුණපාල මහත්මිය විසින් සහිතක කරන ලද අංක 3749 සහ 2014.01.23 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අය විය යුතු ගෙවීම් කිරීම නවගමුවගේ සුදත් චානක පෙරේරා මහතා විසින් පැහැර ඇති හෙයින්, එහි අංක 1837, 2754 හා 3749 දරන බැඳුම්කර මත රුපියල් හාරලක්ෂ හතළිස් දෙදහස් පන්සියයක (රු. 4,42,500) මුදලක් ද, රුපියල් දෙලක්ෂ හතළිස් පන්දාස් අටසියයක (රු. 2,45,800) මුදලක් ද, රුපියල් අට ලක්ෂ පනස් දහස් පන්සියයක (රු. 8,50,500) මුදලක් ද, රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) මුදලක් ද මහජන බැංකුවට අයවිය යුතුව සහ ලැබිය යුතු ඇත. එබැවින්, 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පැවරී ඇති බලතල යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, රුපියල් හාරලක්ෂ හතළිස් දෙදහස් පන්සියයක (රු. 4,42,500) එකී මුදල ද, 2015.05.31 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකී මුදල මත වර්ෂයකට සියයට පහළොව (15%) බැගින් තවදුරටත් වූ පොළිය ද, රුපියල් දෙලක්ෂ හතළිස් පන් දහස් අට සියයක (රු. 2,45.800) එකී මුදල ද, 2015.05.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් එකී මුදල මත වර්ෂයකට සියයට දහනවය (19%) බැගින් තව දුරටත් වූ පොළිය ද, රුපියල් අට ලක්ෂ පනස් දහස් පන්සියයක (රු. 8,50,500) එකී මුදල ද, 2015.05.01 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් ඒ මත තවදුරටත් වූ පොළිය ද, රුපියල් තිස් ලක්ෂයක (රු. 30,00,000) එකී මුදල ද, 2014.11.30 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට සියයට විස්සයි දශම පහ (20.5%) බැගින් ඒ මත තව දුරටත් වූ පොළිය ද විකිණීමේ ගාස්තු ද එකී මහජන බැංකු පනතේ 29ඕ වගන්තිය යටතේ අයකර ගත යුතු මුදල් ද, එදින තෙක් කරනු ලැබ ඇති ගෙවීම් (කිසිවක් වේ නම්) අඩු කිරීමෙන් පසු, අයකර ගැනීම සඳහා අංක 1837, 2754 හා 3749 දරන උකස් බැඳුම්කර මගින් එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකරු ඊ. අර්වින් පෙරේරා මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උකස්කර කරන ලද දේපළ සහ පරිශ්‍ර පිළිබඳ විස්තර

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, තලංගම උතුර 477 B ග්‍රාමනිලධාරි වසමේ කඩුවෙල ප්‍රාදේශීය සභාව සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ තලංගම උතුර පිහිටියා වූ ද, දැනට වරිපනම් අංක 743/1 D දරන්නා වූ ද, "මාවලගාල්ල" හෙවත් "මාවලගොන්න කුරුඳුවත්ත සහ අම්බලමේවත්ත" යයි කියනු ලබන ඉඩමේ බලයලත් මිනින්දෝරු සිරි ඩී. ලියනසූරිය විසින් සාදන ලද අංක 6436 හා 1996 ජුනි මස 11 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 1A ලෙස ලකුණු කොට නිරූපණය කර ඇත්තා වූ ද, උතුරට : කඩුවෙල පාර ද, නැගෙනහිරට : කඩුවෙල පාර සහ ලොට් 1B කොටස ද, දකුණට : මෙම ඉඩමේ ලොට් 2 කොටස ද, බස්නාහිරට : පාර ද (ලොට් 23) මායිම් වන්නා වූ ද, එකී අංක 6436 දරන පිඹුරට අනුව පර්චස් හයයි දශම පහක් (අ. 0, රූ. 0, පර්. 6.5) විශාල වූ ද, බෙදා වෙන් කරන ලද මුළු ඉඩම් කොටස සහ එහි පිහිටි ගොඩනැගිලි, ගහකොළ, වැවිලි හා ඊට අනුබද්ධ වෙනත් සියලු දේත්ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
(කොළඹ පිටත)

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය (කොළඹ පිටත),
අංක 177/A, හයිලෙවල් පාර,
නුගේගොඩ.

05 - 73

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

2016.03.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2007.09.19 දිනැති අංක 1263 සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. කිතුල්ගොඩ විසින් සහතික කරන ලද 2011.11.22 දිනැති අංක 3116 දරන බැඳුම්කර අනුව අයිරාව මත 2016.02.02 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් තිස්එක් ලක්ෂ හතළිස් හතර දහස් තුන්සිය අසූතුනයි ශත පනස් හයක (රු. 31,44,383.56)ක මුදල සමග රුපියල් ලක්ෂ විසිපහක (රු.25,00,000) මුදලක් මත වසරකට සියයට දාහතර (14%) බැගින් 2016.02.03 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පොළියක් ද, පළමුවන ණය මත 2016.02.02 තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හැටහතර ලක්ෂ අනූඅටදහස් තුන්සිහ හැත්තෑ දෙකයි ශත විස්ස (රු. 64,98,372.20)ක මුදලක් සමග රුපියල් පනස්ලක්ෂ අනූඑක්දහස් හත්සිය හතළිස් හයයි ශත තිස්හතර (රු.50,91,746.34)ක මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් පොළියක් ද, 2016.02.03 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් තවදුරටත් පොළිය ද, දෙවන ණය මුදල මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් විසිහතර ලක්ෂ පනස්හත් දහස් නවයයි ශත දොළහ (රු. 24,57,009.12)ක මුදලක් සමග රුපියල් දහනව ලක්ෂ හතළිස්දෙදහස් හාරසිය එකයි ශත හැට හත (රු. 19,42,401.67)ක මුදලක් මත වසරකට සියයට දහතුන (13%) බැගින් තවදුරටත් පොළියක් ද 2016.02.03 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් පන්නිපිටිය, කොට්ටාව, කුලසෙවන මාවතේ, අංක 700/4 හි වික්‍රමරත්න විජේතුංග මයා සහ මැණික්පුර ගෙදර වයලට් මිය (දෙහිවල, රෝහල පාර, අංක 118හි වික්‍රම එන්ටර්ප්‍රයිසස් හවුල්කරුවෝ වෙති) යන අය වෙතින් අයවිය යුතු ඇත.

2. එකී 2007.09.19 දිනැති අංක 1263 දරන උකස් බැඳුම්කරය සහ 2011.11.22 දිනැති අංක 3116 දරන උකස් බැඳුම්කර අනුව අයිරාව මත අයවිය යුතු රුපියල් තිස්එක් ලක්ෂ හතළිස් හතර දහස් තුන්සිය අසූතුනයි ශත පනස් හයක (රු. 31,44,383.56)ක මුදල සමග 1 වැනි

ණය මුදල මත අයවිය යුතු රුපියල් හැටහතර ලක්ෂ අනූඅටදහස් තුන්සිය හැත්තෑ දෙකයි ශත විස්ස (රු. 64,98,372.20)ක මුදල සමග 2 වැනි ණය මුදල මත අයවිය යුතු රුපියල් විසිහතර ලක්ෂ පනස්හත් දහස් නවයයි ශත දොළහ (රු. 24,57,009.12) ක මුදල මත 2016.01.08 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, දෙහිවල ශාඛාවේ ජ්‍යෙෂ්ඨ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 496 දරන කොට්ටාව දකුණ ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, හේවාගම්කෝරළේ, පල්ලේපත්තුවේ, මහරගම නගර සභා සීමාවේ කොට්ටාවෙහි පිහිටි "ඇටඹගහවත්ත" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි ඇති සියලු දේ ද ඇතුළත්ව බලයලත් මිනින්දෝරු මර්වින් සමරනායක විසින් සාදන ලද 1999 දෙසැම්බර් මස 27 දිනැති අංක 6799 දරන පිඹුරෙහි ලොට් 4 ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 4 උතුරට : ලොට් 1 ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : ලොට් 1A (අංක 6744 දරන පිඹුරෙහි ලොට් 1A (අඩි 20 පළල පාරට වෙන් කල කොටස) ද බස්නාහිරට : ඩී. ඩී. කේ. සේනානායකට අයත් ඇටඹගහවත්ත ද මායිම්ව එකී අංක 6799 දරන පිඹුරට අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1232/257 හි ලියාපදිංචි කර ඇත.

එකී කොට්ටාවෙහි පිහිටි "ඇටඹගහවත්ත" නැමති ඉඩමෙහි අංක 6799 දරන පිඹුරෙහි ලොට් 22 (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 22 උතුරට : ලොට් 19, 18, 17 සහ 16 ද, නැගෙනහිරට : අංක 6808 දරන පිඹුරෙහි ලොට් A සහ අංක 6744 දරන පිඹුරෙහි ලොට් 3A (අඩි 20 පළල පාරට වෙන් කළ කොටස) ද , දකුණට : අංක 367 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : අංක 6744 දරන පිඹුරෙහි ලොට් 1A සහ අංක 367 දරන පිඹුරෙහි ලොට් 2 ද මායිම්ව එකී අංක 6799 දරන පිඹුරට අනුව පර්චස් දහනවයක (අ. 0, රූ. 0, පර්. 19) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1282/258 හි ලියාපදිංචි කර ඇත.

එකී කොට්ටාවෙහි පිහිටි "ඇටඹගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් සාදන ලද 1999 නොවැම්බර් මස 6 වැනි දිනැති අංක 6744 (එහෙත් අංක 6799 ලෙස ලියාපදිංචිව ඇති) දරන පිඹුරෙහි ලොට් 1A (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1A උතුරට : අංක 352 දරන පිඹුරෙහි ලොට් 2 (අඩි 20 පළල පාර) සහ ලොට් 1B ද, නැගෙනහිරට : ලොට් 1C ද, දකුණට : අංක 367 දරන පිඹුරෙහි ලොට් 2 ද, බස්නාහිරට : ලොට් 1B සහ 1D ද මායිම්ව එකී අංක 6744 දරන පිඹුරට අනුව පර්චස් දහනවයක (අ. 0, රූ. 0, පර්. 19) බිම ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1232/312හි ලියාපදිංචි කර ඇත.

එකී කොට්ටාවෙහි පිහිටි "ඇටඹගහවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් සාදන ලද 2000 ජනවාරි මස 6 දිනැති අංක 6808 දරන පිඹුරෙහි ලොට් 3A (පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 3A උතුරට : බලයලත් මිනින්දෝරු එම්. සමරනායක විසින් සාදන ලද 1989 දෙසැම්බර් මස 19 දිනැති අංක 2802 දරන පිඹුරෙහි ලොට් 3 හි ඉතිරි කොටස ද, නැගෙනහිරට : දුම්රිය පොළ මාවත ද, දකුණට : අංක 2802 දරන පිඹුරෙහි ලොට් 3 හි ඉතිරි කොටස ද, බස්නාහිරට : අංක 2802 දරන පිඹුරෙහි 22 ද මායිම් ව එකී අංක 6808 දරන පිඹුරට අනුව පර්චස් අටක (අ. 0, රූ. 0, පර්. 8) බිම ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 1232/260හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. එස්. එම්. පී. ගුණතිලක මිය,
ජ්‍යෙෂ්ඨ කළමනාකාරිණී.

ලංකා බැංකුව,
දෙහිවල.

05 - 98

---

### ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2016.03.16 වැනි දින පවත්වන ලද රැස්වීමක දී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. කේ. එස්. එම්. රත්නායක විසින් සහතික කරන ලද 2003.04.10 දිනැති අංක 686 සහ 2003.10.17 දිනැති අංක 754 දරන උකස් බැඳුම්කරය සහ ප්‍රසිද්ධ නොතාරිස් ඩී. වීරසූරිය විසින් සහතික කරන ලද 2006.04.26 දිනැති අංක 664 දරන උකස් බැඳුම්කරය අනුව 2016.02.22 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් හයකෝටි දහඅටලක්ෂ තිස්අටදහස් හයසිය විසිහතයි ශත අනූහතර (රු. 6,18,38,627.94)ක මුදල සමග තුන්කෝටි හැත්තෑහය ලක්ෂ අනූහය දහස් අටසිය හැට එකයි ශත විසිහය (රු.3,76,96,861.26) ක මුදල මත වසරකට සියයට පහළොව (15%) බැගින් පොළියක් 2016.02.23 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මහරගම, නාවින්න, හයිලෙවල් පාරේ, අංක 240/3හි යූරෝ ලංකා රෙසිඩන්සස් (පුද්ගලික) සමාගම (මහරගම, නාවින්න, හයිලෙවල් පාරේ. අංක 240/3 හි වර්ණසූරිය ආරච්චිලාගේ සරත්චන්ද්‍ර වර්ණසූරිය මහතා සහ වැලිවත්තේ මෞලි චන්ද්‍රිකා විජේවර්ධන මිය යන අය අධ්‍යක්ෂවරු වෙති) වෙතින් අයවිය යුතුව ඇත.

2003.04.10 දිනැති එකී අංක 686 දරන උකස් බැඳුම්කරය ද, 2003.10.17 දිනැති අංක 754 දරන උකස් බැඳුම්කරය සහ 2006.04.26 දිනැති අංක 664 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු රුපියල් හයකෝටි දහඅටලක්ෂ තිස්අටදහස් හයසිය විසිහතයි ශත අනූහතර (රු. 6,18,38,627.94)ක මුදල සමග 2016.02.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලියද, ලංකා බැංකු ආඥපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී. ඇන්ඩ් එච් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේ ද, ලංකා බැංකු ආඥපනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, නුගේගොඩ ශාඛාවේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, අංක 533A දරන රත්තනපිටිය ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, පිළියන්දල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, බොරලැස්ගමුව මහනගර සභා සීමාවේ, සල්පිටි කෝරළේ පල්ලේපත්තුවේ, බොරලැස්ගමුවෙහි පිහිටි "මඩුගහඕවිට" නැමති ඉඩමට එහි ඇති ගොඩනැගිලි, ගහකොළ සහ වගාවන් ඇතුළත්ව බලයලත් මිනින්දෝරු බී. එස්. අලහකෝන් විසින් සාදන ලද 2013 මාර්තු මස 09 දිනැති අංක 2602 දරන පිඹුරෙහි ලොට් 1 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 1 උතුරට : පෙඩ්රික් අල්ලිස් සහ වෙනත් අය උරුමකම් කියන ඉඩම සහ ඇල ද, නැගෙනහිරට : ලොට් 2 (ඇලට වෙන් කළ කොටස) ද, දකුණට : ජී. එච්. පෙරේරා මාවතේ වරිපනම් අංක 88 දරන පරිශ්‍රය ද, බස්නාහිරට : ජී. එච්. පෙරේරා මාවත ද මායිම් ව එකී අංක 2602 දරන පිඹුරට අනුව රූඩ් තුනයි පර්චස් දාහතරයි දශම දෙකක (අ. 0, රූ. 3, පර්. 14.2) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය දෙල්කඳ නුගේගොඩ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2661/242 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. කොඩිතුවක්කු මිය,
ප්‍රධාන කළමනාකාරිණී

ලංකා බැංකුව,
නුගේගොඩ.

05 - 99

---

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන ස දැනුම්දීම

2016.03.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් ජී. සී. පී. තිලකරත්න විසින් සහතික කරන ලද 2006.11.22 දිනැති අංක 3037 දරන උකස් බැඳුම්කරයට අනුව 2016.02.22 වැනි දින තෙක් මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් දෙකෝටි පනස්හය ලක්ෂ තිස්නව දහස් හත්සිය දහඅටයි ශත හැටපහ (රු. 2,56.39,718.65)ක මුදල සමග රුපියල් එක්කෝටි දහඅට ලක්ෂ දහහතර දහස් හයසිය අනූහයයි හත හතළිස් පහ (රු. 1,18,14,696.45)ක මුදල මත වසරකට සියයට දාහතර (14%) බැගින් පොළියක් 2016.02.23 වැනි දින සිට ගෙවීම නිමකරන දිනය තෙක් මහරගම, නාවින්න, හයිලෙවල් පාරේ, අංක 240/3හි වැලිවත්තගේ මෞලි චන්ද්‍රිකා අමරසේකර මහත්මිය යන අයගෙන් අයවිය යුතුව ඇත.

2. 2006.11.22 දිනැති එකී අංක 3037 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු රුපියල් දෙකෝටි පනස්හය ලක්ෂ තිස්නව දහස් හත්සිය දහඅටයි ශත හැටපහ (රු. 2,56.39,718.65)ක මුදල සමග 2016.02.23 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොලිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් එච්. ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥ පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥ පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, නුගේගොඩ අධිශ්‍රේණි ශාඛාවේ ප්‍රධාන කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 514 දරන වැලිකඩ-නැගෙනහිර ග්‍රාමසේවා කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාවේ, ඇතුල්කෝට්ටේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර පාරේ වරිපනම් අංක 463/2A දරන "ඒදණ්ඩේ පිල්ලෑව සහ නෙලුම්වල කුඹුර ඒදණ්ඩේ පිල්ලෑව කීනගහවතුර හෙවත් කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2000 පෙබරවාරි මස 21 දිනැති අංක 3370 දරන පිඹුරෙහි ලොට් C ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් C උතුරට : ලොට් B ද, නැගෙනහිරට : එකී පිඹුරෙහි ලොට් B සහ ජී. ඩබ්. ප්‍රනාන්දු විසින් උරුමකම් කියනු ලබන අංක 152 දරන පිඹුරෙහි ලොට් B ද, දකුණට : එකී පිඹුරෙහි ලොට් D ද, බස්නාහිරට : එකී පිඹුරෙහි ලොට් D සහ අංක 3263 දරන පිඹුරෙහි ලොට් 09 (අඩි 20 පළල පාර) ද මායිම්ව එකී අංක 3370 දරන පිඹුර ප්‍රකාර පර්චස් අටක (අ. 0, රූ. 0, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2442/286 හි ලියාපදිංචි කර ඇත.

අංක 3370 දරන පිඹුරෙහි එකී ලොට් C පහත විස්තර කර ඇති ලොට් 9 ට සමානය (අංක 3474 දරන පිඹුරෙහි සිදුකර ඇති පාදක සටහන අනුව)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 514 දරන වැලිකඩ-නැගෙනහිර ග්‍රාමසේවා කොට්ඨාසයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, ශ්‍රී ජයවර්ධනපුර මහනගර සභා සීමාවේ, ඇතුල්කෝට්ටේ පිහිටි ශ්‍රී ජයවර්ධනපුර පාරේ වරිපනම් අංක 463/2A දරන "ඒදණ්ඩේ පිල්ලෑව සහ නෙලුම්වල කුඹුර ඒදණ්ඩේ පිල්ලෑව කීනගහවතුර හෙවත් කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 2000 සැප්තැම්බර් මස 03 දිනැති අංක 3374 දරන පිඹුරෙහි උතුරට : ලොට් 8 ද, නැගෙනහිරට : pp 6254හි ලොට් 12 ද, දකුණට : ලොට් 10 ද, බස්නාහිරට : ලොට් 7 ( අඩි 10 පළල පාරට වෙන් කළ කොටස) ද මායිම්ව එකී අංක 3474 දරන පිඹුරට අනුව පර්චස් අටක (අ. 0, රූ. 0, පර්. 8) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ වගාවන් සහ වෙනත් සියලුදේ සමග වේ.

එකී ඇතුල්කෝට්ටේ පිහිටි ඒදණ්ඩේ පිල්ලෑව සහ නෙලුම්වල කුඹුර "ඒදණ්ඩේ පිල්ලෑව කීනගහ වගුර හෙවත් කුඹුර" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ගාමිණී බී. දොඩන්වෙල විසින් සාදන ලද 1999 ඔක්තෝබර් මස 15 දිනැති අංක 3263 දරන පිඹුරෙහි ලොට් 9 (අඩි 20 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 9 උතුරට : බලයලත් මිනින්දෝරු ජී. ඩබ්. ප්‍රනාන්දු විසින් සාදන ලද අංක 152 දරන පිඹුරෙහි ලොට් C ද, නැගෙනහිරට : අංක 3370 දරන පිඹුරෙහි ලොට් B, C, D හා E ද, දකුණට : ශ්‍රී ජයවර්ධනපුර මාවත ද, බස්නාහිරට : අංක 3263 දරන පිඹුරෙහි ලොට් 03, 04, 06 සහ අංක 3263 දරන පිඹුරෙහි ලොට් 02 සහ අංක 3370 දරන පිඹුරෙහි ලොට් Aද මායිම්ව එකී අංක 3263 දරන පිඹුරට

අනුව පර්චස් විසිපහයි දශම තුනක (අ. 0, රූ. 0, පර්. 25.3) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර, මෙය ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ M 2442/265 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. කොඩිතුවක්කු මිය,
ප්‍රධාන කළමනාකාරිණී.

ලංකා බැංකුව,
නුගේගොඩ.

05 - 100

---

## ලංකා බැංකුව

### 1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥාපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2016.03.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඒ. ඩී. පී. ආර්. ගුණවර්ධන විසින් සහතික කරන ලද 2014.08.04 දිනැති අංක 700 දරන උකස් බැඳුම්කරය අනුව 2016.01.26 වැනි දින තෙක් මත මුල් මුදල හා පොළිය වශයෙන් රුපියල් පනස්එක් ලක්ෂ හයදහස් අටසිය අනූ එකයි ශත අනූව (රු. 51,06,891.90) මුදල සමග රුපියල් හතළිස් අට ලක්ෂ පනස්නවදහස් පන්සිය හතළිස් හතරයි ශත තිස් හතර (රු. 48,59,544.34) මුදල් මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2016.01.26 වැනි දින සිට තවදුරටත් පොළිය ද අයිරාව මත 2016.01.26 වැනි දින දක්වා මුල් මුදල හා පොළිය රුපියල් විසිලක්ෂ පනස්නව දහස් හැත්තෑ හයයි ශත අට (රු. 20,59,076.08)ක මුදල සමග රුපියල් විසිලක්ෂය (රු. 20,00,000)ක මුදල මත වසරකට සියයට දහහතර (14%) බැගින් තවදුරටත් පොළියක් ද 2016.01.27 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හෝකන්දර උතුර, රත්නාරාම පාරේ, අංක 379/5D හි තරුන්ද ඉන්ටර්නැෂනල් (හෝකන්දර උතුර, රත්නාරාම පාරේ, 379/5D හි ඩිලාන් ඩිල්රුක් වීරසේකර සහ යාපගේ වීරසේකර යන මහත්වරුන් අධ්‍යක්ෂවරු වෙති) වෙතින් අයවිය යුතුව ඇත.

2. 2014.08.04 දිනැති එකී අංක 700 දරන උකස් බැඳුම්කරය මත ණය මුදල මත අයවිය යුතු රුපියල් පනස්එක් ලක්ෂ හයදහස් අටසිය අනූ එකයි ශත අනූව (රු. 51,06,891.90) මුදල සමග අයිරාව මත අයවිය යුතු මුදල් රුපියල් විසිලක්ෂ පනස්නව දහස් හැත්තෑ හයයි ශත අට (රු. 20,59,076.08)ක මුදල මත 2016.01.27 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥාපනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොළොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි පදිංචි ටී ඇන්ඩ් ඔක්ෂන්ස්හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතා හට එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මාලබේ ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 494 හෝකන්දර උතුර ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ හෝකන්දර උතුර පිහිටි රත්නාරාම පාරේ, වරිපනම් අංක 379/5D (දැනට වරිපනම් අංක 75/3) දරන "මූකලානෙවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් සාදන ලද 2011 අගෝස්තු මස 18 දිනැති අංක 2114 දරන පිඹුරෙහි ලොට් D3A ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D3A උතුරට : අඩි 15 පළල පාර (අංක 549 දරන පිඹුරෙහි ලොට් E) ද, නැගෙනහිරට : අංක 549 දරන පිඹුරෙහි ලොට් D2 ද (මෙයද අංක 2082 දරන පිඹුරෙහි ලොට් D2 ය), දකුණට : අංක 691 දරන පිඹුරෙහි ලොට් 1, 2, 6 සහ 7 ද බස්නාහිරට : අංක 549 දරන පිඹුරෙහි ලොට් D4A ද මායිම්ව එකී අංක 2114 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම පහයි පහක (අ. 0, රූ. 0, පර්. 15.55) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිල්ල, ගහකොළ වගාවන් ඇතුළු වෙනත් සියලුදේ ද සමග වේ.

අංක 2114 හි එකී ලොට් D3A පහත විස්තර කර ඇති ඉඩමෙහි නැවත මැනීමකි.

එකී හෝකන්දර උතුර රත්නාරාම පාරේ, පිහිටි "මූකලානෙවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් සාදන ලද 1997 ජනවාරි මස 15 දිනැති අංක 549 දරන පිඹුරෙහි ලොට් D3A ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D3A උතුරට : ලොට් E ද, නැගෙනහිරට : ලොට් D2 ද, දකුණට : අංක 691 දරන පිඹුරෙහි ලොට් 1, 2, 6 හා 7 ද, බස්නාහිරට : ලොට් D4A ද මායිම් ව එකී අංක 549 දරන පිඹුරට අනුව පර්චස් පහළොවයි දශම පහයි පහක (අ. 0, රූ. 0, පර්. 15.55) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ වගාවන් ඇතුළු වෙනත් සියලුදේ ද අයත් වේ. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලේ B 513/97 හි ලියාපදිංචි කර ඇත.

#### දෙවන උපලේඛනය

ඉහත කී ආකාරයට හෝකන්දර උතුර රත්නාරාම පාරේ, පිහිටි "මූකලානෙවත්ත" නැමති ඉඩමෙහි එකී අංක 549 දරන පිඹුරෙහි ලොට් E (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නීර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් E උතුරට : රජයේ ඉඩම ද, නැගෙනහිරට : රත්නාරාම පාර ද, දකුණට : අංක 549 දරන පිඹුරෙහි ලොට් D1, D2, D3A සහ D4A ද අංක 153 දරන පිඹුරෙහි ලොට් 5 ද, බස්නාහිරට : ලොට් B1 ද මායිම්ව එකී අංක 549 දරන පිඹුරට අනුව පර්චස් දාහතරයි දශම හයයි තුනක (අ. 0, රූ. 0, පර්. 17.63) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලේ B 412/84 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. එස්. විජේකෝන් මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
මාලබේ.

05 - 101

### ලංකා බැංකුව

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥපනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීමයි

2016.03.16 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එස්. ටී. පෙරේරා විසින් සහතික කරන ලද 2012.12.18 දිනැති අංක 782 සහ 2013.09.09 දිනැති අංක 1041 දරන උකස් බැඳුම්කර අනුව 2016.02.16 වැනි දින තෙක් 1 වන ණය මුදල මත මුල් මුදල හා පොලිය වශයෙන් රුපියල් එක්කෝටි අනූපන් ලක්ෂ හැටපන් දහස් දෙසිය අනූතුනයි ශත පනස් හතර (රු. 1,95,65,293.54) මුදල සමග රුපියල් එක්කෝටි හැත්තෑපන්ලක්ෂ දෙසිය අනූ තුනයි ශත පනස් හතර (රු. 1,75,00,293.54) මුදල මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් 2016.02.17 වැනි දින සිට තවදුරටත් පොළිය ද, 2 වන ණය මත 2016.02.16 වැනි දින තෙක් මුල් මුදල හා පොළිය මත රුපියල් එක්කෝටි අසූහත් ලක්ෂ විසිනව දහස් අටසිය නවයයි ශත හැට හතර (රු. 1,87,29,809.64)ක මුදල සමග රුපියල් එක්කෝටි හැත්තෑදෙලක්ෂ දොළොස් දහස් හයසිය පහළොවයි ශත හතළිහ (රු. 1,72,12,615.40)ක මුදල මත වසරකට සියයට දොළහයි දශම පහ (12.5%) බැගින් තවදුරටත් පොලියක් ද, 2016.02.17 වැනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් හෝකන්දර උතුර, රත්නාරාම පාරේ, අංක 379/5D හි තරුන්ද ඉන්ටර්නැෂනල් (හෝකන්දර උතුර, රත්නාරාම පාරේ, 379/5D හි ඩිලාන් ඩිල්රුක් වීරසේකර සහ යාපගේ වීරසේකර යන මහත්වරුන් අධ්‍යක්ෂවරු වෙති) වෙතින් අයවිය යුතුව ඇත.

2. 2012.12.18 දිනැති අංක 782 දරන උකස් බැඳුම්කරය සහ 2013.09.09 දිනැති අංක 1041 දරන උකස් බැඳුම්කර මත 1 වන ණය මුදල මත අයවිය යුතු රුපියල් එක්කෝටි අනූපන් ලක්ෂ හැටපන් දහස් දෙසිය අනූතුනයි හත පනස් හතර (රු. 1,95,65,293.54) මුදල සමග 2 වන ණය මුදල මත අයවිය යුතු රුපියල් එක්කෝටි අසූහත් ලක්ෂ විසිනව දහස් අටසිය නවයයි ශත හැට හතර (රු. 1,87,29,809.64) මුදල මත 2016.02.17 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අයවිය යුතු පොළිය ද, ලංකා බැංකු ආඥපනතේ 26 වෙනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අයකර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවතේ, අංක 50/3 හි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාට එකී ලංකා බැංකු ආඥ පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥ පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ, මාලබේ ශාඛාවේ කළමනාකරු හට මෙයින් අවසර දී බලය පවරනු ලැබේ.

#### පළමු උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේපත්තුවේ, කඩුවෙල මහනගර සභා සීමාව තුළ කඩුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ සහ අංක 494 හෝකන්දර උතුර ග්‍රාමසේවා නිලධාරි කොට්ඨාසයේ හෝකන්දර උතුර පිහිටි රත්නාරාම පාර දිගට පිහිටි රත්නාරාම පාරේ, වරිපනම් අංක 75/2 දරන "මූකලානෙවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් සාදන ලද 1997 ජනවාරි මස 15 දිනැති අංක 549 දරන පිඹුරෙහි ලොට් D2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D2 උතුරට : ලොට් E (අඩි 15 පළල පාර) ද, නැගෙනහිරට : ලොට් D1 ද, දකුණට : අංක 691 දරන පිඹුරෙහි ලොට් 1, 2, 6 සහ 7 ද බස්නාහිරට : ලොට් D3A ද මායිම්ව එකී අංක 549 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 412/86හි ලියාපදිංචි කර ඇත.

එකී ලොට් D2 මෑතකදී කරන ලද අංක 2082 දරන පිඹුරට අනුව පහත ආකාරයට විස්තර කර ඇත.

ඉහත කී ආකාරයට හෝකන්දර උතුර රත්නාරාම පාරේ දිගට පිහිටි " මූකලානෙවත්ත" නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ජී. ජී. පියසේන විසින් සාදන ලද 2011 ජූනි මස 19 දිනැති අංක 2082 දරන පිඹුරෙහි ලොට් D2 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් D2 උතුරට : අඩි 15 පළල පාර (අංක 549 දරන පිඹුරෙහි ලොට් E) ද, නැගෙනහිරට : අංක 549 දරන පිඹුරෙහි ලොට් D1 ද, දකුණට : අංක 691 දරන පිඹුරෙහි ලොට් 1. 2, 6 හා 7 ද, බස්නාහිරට : අංක 549 දරන පිඹුරෙහි ලොට් D3A ද මායිම් ව එකී අංක 2082 දරන පිඹුරට අනුව පර්චස් විස්සක (අ. 0, රූ. 0, පර්. 20) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර එහි ඇති ගොඩනැගිලි, ගහකොළ වගාවන් වේ.

#### දෙවන උපලේඛනය

ඉහත කී ආකාරයට හෝකන්දර උතුර රත්නාරාම පාර දිගට පිහිටි "මූකලානෙවත්ත" නැමති ඉඩමෙහි එකී අංක 549 දරන පිඹුරෙහි ලොට් E (අඩි 15 පළල පාරට වෙන් කළ කොටස) ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපණය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් E උතුරට : රජයේ බදු ඉඩම ද, නැගෙනහිරට : රත්නාරාම පාර ද, දකුණට : අංක 153 දරන පිඹුරෙහි ලොට් 5 සහ ලොට් D1, D2, D3A සහ D4A ද, බස්නාහිරට : ලොට් B1 ද මායිම්ව එකී අංක 549 දරන පිඹුරට අනුව පර්චස් දාහතයි දශම හයයි තුනක (අ. 0, රූ. 0, පර්. 17.63) බිම් ප්‍රමාණයකින් යුක්ත වන අතර මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලේ B 412/84 හි ලියාපදිංචි කර ඇත.

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එස්. එස්. විජේකෝන් මිය,
කළමනාකාරිණී.

ලංකා බැංකුව,
මාලබේ.

05 - 102

---

### ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී බැංකුවේ අනුප්‍රාප්තිකයා වන ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2016 පෙබරවාරි මස 24 වැනි දින දී ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

## අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කේ. ගීකියනගේ විසින් ලියා සහතික කරන ලද අංක 218 හා 2012 මාර්තු මස 01 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත වූ ද ලියාපදිංචි අංක පීවී 82475 දරන්නා වූ ද ලියාපදිංචි කාර්යාලය පිළියන්දල පිහිටා ඇත්තා වූ ද (මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) ජේ. එස්. ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් නමැති සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2015 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත ජේ. එස්. ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් ඉහත කී අංක 218 දරන උකස් බැඳුම්කරය මත, ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් හය ලක්ෂ විසිදෙදහස් පන්සිය තිහකුත් ශත විසි හතරක (රු. 6,22,530.24) මුදලක් සහ 2015 දෙසැම්බර් මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තුන් ලක්ෂ අසූතුන් දහස් දෙසිය විසිහයකුත් ශත දහහතරක් (රු. 3,83,226.14) මුදලක් සඳහා වර්ෂයකට සියයට දහඅටකුත් දශම පහක (18.5%) අනුපාතිකය මත පොලිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හය ලක්ෂ විසිදෙදහස් පන්සිය තිහකුත් ශත විසි හතරක (රු. 6,22,530.24) මුදල සහ එයින් රුපියල් තුන් ලක්ෂ අසූතුන් දහස් දෙසිය විසිහයකුත් ශත දහහතරක් (රු. 3,83,226.14) මුදලක් සඳහා 2015 දෙසැම්බර් 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා වර්ෂයකට සියයට දහඅටකුත් දශම පහ (18.5%) අනුපාතිකය මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්යේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 218 දරන උකස් බැඳුම්කරය මගින් ජේ. එස්. ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

අංක 218 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

මෙහි පහත සඳහන් චංචල දේපළ, එනම්,

| අයිතම අංකය | විස්තරය | ඒකක සංඛ්‍යාව |
|---|---|---|
| 1 | බැග්ස් ඔන් රෝල් මැෂින්<br>සිංගල් ඩෙක් බෑග් මේකිං මැෂින්, පාකිං ප්ලාස්ටික් මැෂින්<br>මොඩ්ල් අංකය BJA 2<br>අනුක්‍රමික අංකය 32110<br>තායිවාන් | 01 |
| 2 | සිංගල් ඩෙක් බෑග් මේකිං මැෂින්<br>මොඩ්ල් අංකය SAMA - SMD 28 SC<br>අනුක්‍රමික අංකය 678<br>මැලේසියාව | 01 |
| 3 | සිංගල් ඩෙක් බෑග් මේකිං මැෂින්<br>මොඩ්ල් අංකය SAMD - SMD 28 SC<br>අනුක්‍රමික අංකය 2605<br>මැලේසියාව | 01 |
| 4 | හයිඩ්‍රොලික් පන්චර් හැන්ඩ්ල් කට් මැෂින්<br>ජපන් | 01 |
| 5 | එක්ස්ට්‍රෑඩර් මැෂින්<br>හයි ස්පීඩ්, තායිවාන්, සිංගල් බැරල් මැෂින්<br>අනුක්‍රමික අංකය 890705<br>මොඩ්ල් අංකය EX 3600E අ.බ. 20 මෝටරය සහිතව | 01 |
| 6 | සිංගල් බැරල් එක්ස්ට්‍රෑඩර් මැෂින්<br>නෝමල් මැෂින්<br>මොඩ්ල් අංකය 2010E | 01 |

ඇතුළුව දැනට පිළියන්දල, මාම්පේ, කොට්ටාව පාර, අංක 87 දරන පරිශ්‍රය තුළ සහ මත දැනට තිබෙන සියලු චංචල දේපළ අමතර කොටස් උපාංග හා මෙවලම් සහ එකී සමාගම දැනටව්‍යාපාරය කරගෙන යන හා මින් මතු යම් කාලයක හා කලින් කල ව්‍යාපාරය කරගෙන යනු ලැබිය හැකි වෙනත් යම් ගුදම්, ගබඩා සහ පරිශ්‍ර තුළ සහ මත නැතහොත් එකී චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර සහ උපකරණ සහ අමතර කොටස්, උපාංග සහ මෙවලම් කලින් කල ගබඩාකර දමා හෝ තබා තිබිය හැකි වෙනත් යම් ගුදමක, ගබඩාවක හෝ පරිශ්‍රයක තිබෙන සමාගමේ යන්ත්‍රසූත්‍ර, උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් ද ඉහත කී චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් වෙනුවට ප්‍රතියෝජනය කිරීම පිණිස ඉහත කී ගබඩා, ගුදම් සහ පරිශ්‍රවලට ගෙන එනු ලබන හෝ ගෙන එනු ලැබිය හැකි හෝ අන් ස්ථානයක දමා හෝ තබා තිබිය හැකි එකී සමාගමේ කවර හෝ පිරියත යන්ත්‍ර සූත්‍ර හා උපකරණ සහ අමතර කොටස්, උපාංග හා මෙවලම් ද සමග, සමාගම එහි ව්‍යාපාරය හෝ කර්මාන්තය මින් ඉදිරියට ඉවත් කරගෙන යනු ලැබිය හැකි හෝ පවත්වාගෙන යනු ලැබිය හැකි හෝ ගබඩා කරනු ලැබිය හැකි ස්ථානයක හෝ ස්ථානවල ඇති සමාගමේ එකී සියලු චංචල පිරියත, යන්ත්‍ර සූත්‍ර හා උපරකන සහ අමතර කොටස් උපාංග හා මෙවලම් ද ඇතුළු සියලු චංචල දේපළ.

ඒ. ආර්. ප්‍රනාන්දු,<br>සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී,<br>අංක 73/5, ගාලු පාර,<br>කොළඹ 03

05 - 109

## ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය 2016 පෙබරවාරි මස 24 වැනි දින දී ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එල්. එස්. ජයසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 515 හා 2005 දෙසැම්බර් මස 23 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම් සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි කාර්යාලය කොළඹ පිහිටා ඇත්තා වූ ද ලියාපදිංචි අංක පීවී 15774 දරන (කලින් ලියාපදිංචි අංකය එන් (පීවීඑස්) 37763) මෙහි මින් ඉදිරියට "එකී සමාගම" යනුවෙන් හැඳින්වෙන, ඔරියන්ට් ගෝල්ඩ් ප්ලස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් යන සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද,

2015 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී අංක 515 දරන උකස් බැඳුම්කරය මත එකී ඔරියන්ට් ගෝල්ඩ් ප්ලස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගමෙන් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවට රුපියල් පනස් දෙලක්ෂ විසිහතර දහස් පණස් හතරකුත් ශත හැටක (රු. 52,24,054/60) මුදලක් සහ 2015 දෙසැම්බර් මස 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පණස් ලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය අසූ දෙකකුත් ශත අසූ පහක (රු. 50,72,882.85) මුදලක් සඳහා

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන පළමු දිනයේ දී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකය (ඒඩබ්ලිව්පීආර්) හෝ,

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන පළමු දිනයේදී ප්‍රතිශෝධනය කරන රඳවාගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය යන මෙයින් ප්‍රතිශෝධන දිනයේදී පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදලවන රුපියල් පනස් දෙලක්ෂ විසිහතර දහස් පණස් හතරකුත් ශත හැටක (රු. 52,24,054/60) වූ මුදල සහ 2015 දෙසැම්බර් 01 වැනි දින පටන් විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් පණස් ලක්ෂ හැත්තෑ දෙදහස් අටසිය අසූ දෙකකුත් ශත අසූ පහක (රු. 50,72,882.85) මුදලක් සඳහා

(අ) එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ජනවාරි, අප්‍රියෙල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන පළමු දිනයේ දී ප්‍රතිශෝධනය කරන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකය (ඒඩබ්ලිව්පීආර්) හෝ,

(ආ) එක් එක් වර්ෂයේ සෑම තුන්මසකට වරක් ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන පළමු දිනයේදී ප්‍රතිශෝධනය කරන රඳවාගැනීමේ බදු අඩුකර ගැනීමෙන් පසු දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී පැවැති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට හතකුත් දශම පහක (7.5%) ආන්තියක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 515 දරන උකස් බැඳුම්කරය මගින් කොළඹ ඔරියන්ට ගෝල්ඩ් ප්ලස් (ප්‍රයිවෙට්) ලිමිටඩ් සමාගම විසින් ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුව වෙත උකස් කර තිබෙන මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි චංචල පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ මෙහි පහත විස්තර කරන ඉඩම හා පරිශ්‍රය පිරියත, යන්ත්‍රසූත්‍ර හා උපකරණ සහ එහි පිහිටි සියලු දේ කෙරෙහි පවත්නා නිදහස් අයිතිවාසිකම් (free hold rights) කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම සමාගම ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 515 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

